# සුබ්බච ජාතකය

තවද එක් සමයෙක්හි අප තිලෝගුරු සර්වඥරාජාත්තමයානන් වහන්සේ ජේතවනාරාමයෙහි වාසය කරණ සේක්. එක්තරා කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ සුබ්බච ජාතකය නිමවා වදාළසේක.

ඒ කෙළෙඹි පුත්‍රයා වනාහි ගම්හි නය එලවමින් භාර්යාව හා එක්ව ගොස් නය එලවා ගෙන ගැලක් ගෙන ගොස් පසුව ණෛමියි. එක්තරා ගෙයක තබා නැවත සැවැත් නුවරට යන්නාහු එක්තරා පර්වතයක් දුටුවාහුය. ඉක්බිත්තෙන් ඔහුගේ භාර්යාතොම කියන්නී ස්වාමිනී ඉදින් මේ පර්වතය ස්වර්ණමය වීනම් මට කිසිවක් දෙන්නෙහිදැයි විචාළීය. එබසට ස්වාමියා කියන්නේ මාගෙන් එලෙස ලබන්ට තෝ කවුරුද මම නොදනෙමි කීයේය. ඉක්බිත්තෙන් ඕ තොම එපමණ කිත් තදවූ සිත් ඇත්තී ඒ කාන්තයෙන්ම මේ පර්වතය ස්වර්ණමය වූ කල්හිදු මට කිසිවක් නොදන්නේයයි කියා නොසතුටු වූවා ඉක්බිති ඒ ස්ත්‍රී පුරුෂ දෙදෙනා බුදුන් වාසය කරන්නා වූ ජේතවන විහාරය සමීපයට ගොස් මාර්ග ශ්‍රමයන් සන්සිඳුවා පැන් බී ගෙණ යම්හයි විහාරයට වන්කල්හි බුදුරජානන් වහන්සේ ද එදා අළුයම් වේලෙහි ඔවුන් දෙදෙනාගේ ශ්‍රොතාපතති ඵලයට බලවත් ප්‍රත්‍යය ඇති බව දැන වදාරා ඔවුන් දෙදෙනාගේ ඊම බලමින් ෂඩ් වර්ණ ඝන බුද්ධ රශ්මීන් ශ්‍රී ශරීරයෙන් නික්මවා මදක් වැඩහුන් සේක. ඒ දෙමහල්ලෝද පැන් බී අවුත් බුදුන් වැඳ එකත්පස්ව උන්නාහුය. සර්වඥයන් වහන්සේ ඔවුන් හා සමඟ පිළිසඳර කථා කොට හෙවත් තමන් වහන්සේ කරා පැමිණි ආගන්තුකයන්ට සන්තෝෂයට කාරණා වදාරා තෙපි දෙදෙනා ලද්දා වූ ධනයත් එලවාලන්ට ගියම්හයි කීවාහුය. එබසට බුදුරජානන් වහන්සේ කිමෙක්ද උපාසිකාව තොපගේ වල්ලභ වූ පුරුෂතෙම තොපට හිතසිත් ඇත්තෝද උපකාරීව වාසය කරන්නේදැයි විචාරා වදාළසේක. එබසට ස්වාමිනි භාග්‍යවත් වූ බුදුරජානන් වහන්ස මම මොහු කෙරෙහි සෙනහයෙන් යුක්ත යෙමි මේ වනාහි මා කෙරෙහි සෙනහයක් නැත්තේය. ඊට කාරණා කවරේද? අද දවස් මා විසින් පර්වතයක් දැක මේ පර්වතය ස්වර්ණමය වීනම් මට කිසිවක් දෙන්නෙහි දැයි විචාරණ ලද්දෝතෝ ඒ මාගෙන් ලැබීමට කවරෙක්දැයි කිසිවකුත් නොදෙමියි කීයේය. එසේ හෙයින් මෙබඳු වූ කිසි ස්නේහ ගුණයක් නැති මෙතෙම තද වූ සිත් ඇත්තේයයි කීවාය. එබසට බුදුරජානන් වහන්සේ එඹල උපාසිකාව මෙනම් දෙයක් නොවන්නේ වී නම් යම් කලෙක වනාහි තොපගේ ගුණ සිහි කෙරේද එදවස් වනාහි සියලු ඓශ්වර්‍ය්‍ය ම දෙන්නේයයි වදාරා බුදුන් විසින් වදාළ වචනය ඇසූ උපාසිකා තොම ස්වාමිනි බුදුරජානන් වහන්ස සියළු ඓශ්වර්‍ය්‍ය ලැබීම නම් කවරේදැයි ඔවුන් විසින් ආරාධිත වූ බුදුරජානන් වහන්සේ අතීත කථාව ගෙන හැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ කල්හි පුරණ ලද පෙරුම් ඇති මහබෝධිසත්ව තෙම එ රජහුගේ සියලු ක්‍රියා සිද්ධ කරන්නාවූ අමාත්‍ය විය. ඉක්බිත්තෙන් එක් දවසක් ඒ බරණැස් රජතෙම තම පුත්‍ර වූ යුව රජහු උපස්ථානයට එන්නා දැක මේ තෙමේ මාගේ අභ්‍යන්තරයෙහි වාසය නොකෙරේවයි සිතා ඒ අමාත්‍යයා සමීපයට කැඳවා එම්බා සගය මම යම්තාක් කල් ජීවත් වන්නෙම් ඒ තාක් කල් මෙතෙම මේ නුවරෙහි වාසය කිරීම නොලබන්නේය. අන්‍ය ස්ථානයක වාසය කොට මාගේ ඇවෑමෙන් රාජ්ජය කරවයි කීයේය. එතෙම යහපතැයි ගිවිස පිය රජහු වැඳ ප්‍රධාන භාර්යාව හා සමඟ බරණැස් නුවරින් නික්ම ප්‍රත්‍යනත ජනපදයකට ගොස් වනාහි පන්සලක් කොට වනමුල් වන ඵලාඵල අනුභව කෙරෙමින් වාසය කරන්නේය. මෑත භාගයෙහි පිය රජතෙම කළුරිය කෙළේය. යුවරජ තෙම තරු බලා ඒ තමාගේ පීතෘ වූ බරණැස් රජ කාල ක්‍රියා කළ බව දැන බරණැස් නුවරට එන්නේ අතරමග එක් පර්වතයක් දුටුවේය.

ඉක්බිත්තෙන් ඔහුගේ භාර්‍ය්‍යාතොම කියන්නී ඉදින් දේවයන් වහන්ස මේ පර්වතය ස්වර්ණමය වී නම් මට මින් කිසිවක් දෙන්නෙහිදැයි විචාළීය. එබසට යුවරජ කියන්නේ තෝ මාගෙන් ලබන්නට කවරෙහිදැයි කිසිවක් නොදෙමියි කීයේය. ඉක්බිත්තෙන් ඕතොම මම ඔහු හා සමඟ වාසය කෙරෙමියි සෙනහයෙන් වාසය කරන්ට නොහැකි වූයේය. මේ පුරුෂ ද මා කෙරෙහි කලකිරිණි. සෙනහව තදවූ සිත් ඇත්තේ රජ්ජයට පැමිණද මෝතොම මට කවර යහපතක් කළාදැයි නොසතුටුවන්නේයයි සිතා ඒ පුරුෂයා හැර වනයට නොගොස් ඔහු හා සමඟ ගියාය. එතෙම රාජ්‍යශ්‍රීයෙහි පිහිටා ඒ ස්ත්‍රිය අගමෙහෙසුනැයි යන යසස් මාත්‍රයක් දුන්නේය. මත්තෙහි වනාහි කළ සත්කාර සම්මානයෙක් නැත්තේය. මෑත කාලයෙහි ඇ ඇති බවත් නොදන්නේය. බෝධිසත්වයන් වහන්සේ සිතන සේක්. මේ ස්ත්‍රී තොම රජහුට උපකාරව වල වාසය කරණ කාලයෙහි මෙපණක් දුක් ගනිමියි සිතා නුකුසී තව මෙරජහට විශ්වාසව සිත පක්ෂ පාත බැව්හි වාසය කළාය. දැන් මෙරජ යනාහි තමහටගත් දුක් පමණක් නොදැන අන්‍ය වූ ස්ත්‍රීන් හා රමණය කෙරෙමින් දවස් අරනේය. යම්සේ මෝතොම සියළු ඓශ්වර්‍ය්‍ය ලබන්නීද ඒ ලබන්නට සුදුසු උපායක් කෙරෙමියි සිතා එක් දවසක්

බෝධිසත්වයන් වහන්සේ බිසෝවරුන් කරා ගොස් වැඳ දෙවීන් වහන්ස දැන් අපි නුඹ වහන්සේගෙන් සෙසු දේ තබා ආභරණ පමණක් නොබලම්හ. කුමක් හෙයින් අප කෙරෙහි උදාසීන භාවයෙන් ප්‍රමාද වූ සේක්ද ඉතා තදවූ සිත් ඇති සේක්නුයි කීසේක. එබසට බිසව් කියන්නාහු එඹා අමාත්‍යයානෙනි තොපට දෙන්නේ මම ලබන්නෙම් වේදැයි කිවුය. නමුත් නොලබන බව කියා රජ්ජුරුවන් වහන්සේ දැන් වනාහි මට කුමක් දෙනසේක්ද එදවස් අතර මගදී පර්වතය දැක සිත අදහනු පිණිස මේ පර්වතය ස්වර්ණමය වීනම් මට මින් කෙතෙක් දෙන සේක්දැයි විචාළ කල්හි මාගේන් ලබන්ට තෝ කවරේදැයි කීයේය. දැන් වනාහි එදවස් ඒ ප්‍රවෘර්තිය රජ්ජුරුවන් ඉදිරියෙහි සිට කියන්නට හැක්කේ වී නම් කියවයි කී කල්හි කීයේය. රජහු සමීපයෙහි සිටියාවූ මම විචාරමි නුඹ වහන්සේ කිව මැනවයි කී කල්හි යහපතැයි කියා බෝධිසත්වයන් වහන්සේ ඒ රාජ දේවිය රජ්ජුරුවන්ට උපස්ථාන කොට සිටි කල්හි විචාරණ සේක්. බිසවුන් වහන්ස මම නුඹ වහන්සේගෙන් කිසිවකුත් නොලබන්ට කාරණා කවරේදැයි විචාල කල්හි බිසවු කියන්නෝ එම්බා සගය මම ලබන්නෙම්වේද නුඹ වහන්සේට දෙන්නේ යයි කියා රජ්ජුරුවන් වහන්සේ එකල් වනයෙහි වාසය කොට එන්නාවූ මාර්ගයෙහි එක් පර්වතයක් දැක ඉදින් මේ පර්වතය ස්වර්ණමය වී නම් ඉන් මට කොපමණ දෙනසේක්දැයි විචාළෙමි. ඒ ලබන්නට තෝ කවරෙක්ද ඉදින් මා දෙන දෙයක් නැතැයි කියා නිරපේක්ෂව හැරියාද මුන් වහන්සේ මම නොහැර එබඳු වූ තැනැත්තන් වහන්සේ දැන් මට කුමක් දෙනසේක්දැයි යනාදීන් මේ ප්‍රවෘර්තිය ප්‍රකාශ කොට කියන්නී, එදවස් ස්වර්ණ පර්වතය වීනම් දෙන සේක්දැයි විචාළාවූ මට ඒ පර්වතය මාගේ වචනයෙන් ස්වර්ණ පර්වතයෙකැයි කී පමණක් විනා ස්වාභාවයෙන් ස්වර්ණමය වූ වචන මාත්‍රයෙන් සැප දෙන්නට හැක්කාවූ පර්වතයද පවා වචනයෙන් නොදුන්නේය. දැන් කුමක් දෙන්නේදැයි කී බිසවුන්ගේ තෙපුල් ඇසූ රජ කියනුයේ මෙසේ කියා යමක් කරතොත් ඒම කිය යුතු වන්නේය. නොකරණ දෙය නොකිය යුතු වන්නේය. නොකරණ දෙය කියන්නාවූ අඥානයාගේ ස්වාභාවය තත්වූ පරිද්දෙන් පණ්ඩිතයෝ හැර දන තුචජ තොට සිතති. අඥානයෝ වචන මාත්‍රයටම සතුටු වන්නාහුයයි කීවාය. රජ්ජුරුවන්ගේ බස් ඇසූ රාජදෙවි රජ්ජුරුවන්ට නමස්කාර කොට කියන්නී රාජ පුරුෂයානන් වහන්ස නුඹ වහන්සේ ස්වාභාව ධර්මයෙහි පිහිටි සේක් වී නම් නුඹ වහන්සේට නමස්කාර වේවයි යමෙක් නුඹවහන්සේගේ රටින් නෙරපණ ලද බැවින් ව්‍යසනය පැමිණියේද ඔහුගේ චිත්තය සත්‍ය වචනයෙහි රමණය කරන්නේ වේදැයි මෙපරිද්දෙන් ඒ රජහුගේ ගුණ කථනය කරන කල්හි ඒ මහබෝසතානන් වහන්සේ ඒ රාජ දේවියගේ ගුණ කියන සේක්. රජ්ජුරුවන් වහන්සේ මේ ලෝකයෙහි යම් ස්ත්‍රියක් දරිද්‍ර ස්වාභාව ඇත්තීද ඕතොම දරිද්‍රයන් හටම වඳින්නීය. කීර්තිමත් වූ උපභෝග පරිභෝග සම්පත්තියෙන් ආඪ්‍ය වූ යම් ස්ත්‍රියක් ඇද්ද ඕතොම එබඳු වූ ආඪ්‍යයක් හට වඳින්නීය. යම් ස්ත්‍රියක් කීර්ති සම්පන්නවූ නම් එබඳු පුරුෂයන්හටම වඳින්නීය. එසේහෙයින් කල්‍යානවූ රාජ දේවීද නුඹ වහන්සේට අකුශල හෙයින් උතුම් වූ භාය්‍ර්‍යා වන්නීයයි කියා බෝධිසත්වයන් වහන්සේ නැවත රජ්ජුරුවන් වහන්සේ වනයෙහි දුක් දෙන වාසය කරණ කල්හිද නුඹ වහන්සේ හා සමාන දුකට පැමිණ වාසය කළ බිසවුන්ට සත්කාර සම්මාන නොකරන්නට සුදුසු නොවන්නේයයි කියා රාජ දේවියගේ ගුණ වර්ණනාකොට ගියේය. රජතෙම ඒ වචනයෙන් සතුටුවූයේ ඒ බිසවුන් තමහට කළගුණය සිහි කරමින් එම්බා පණ්ඩිතයෙනි තොපගේ වචනයෙන් මේ දේවියගේ ගුණ සිහි කරමියි කියා ඒ බිසවට සියළු ඓශය්‍ර්‍ය දුන්නේය. දේවියගේ ගුණ ප්‍රකාශ කළ බෝධිසත්වයන් ද බොහෝ සතටු වූ රජ්ජුරුවෝ මහත් සැපත් ඔබට දුන්නේයයි ශාස්තෘ වූ බුදු රජානන් වහන්සේ මේ දේශනාව ගෙණ හැර දක්වා චතුසසත්‍ය ධර්ම දේශනාව ප්‍රකාශ කොට පූර්වපර සන්ධි ගලපා මේ ජාතකය නිමව වදාළසේක. චතුසසත්‍යයාගේ අවසානයෙහි ඒ දෙමහල්ලෝම ශ්‍රොතාපත්ති ඵලයෙහි පිහිටියාහුය. එකල්හි බරණැස් රජ්ජුරුවෝ නම් මේ කෙළෙඹි පුත්‍රයාය. ඒ රාජ දෙවිතොම මේ උපාසිකාවය පණ්ඩිත අමාත්‍යව උපන්නෙම් බුදු වූ මම්ම වේදැයි තමන් වහන්සේ ගෙන හැර දක්වා වදාළ සේකි.